# පොලිස් මාධ්‍ය කොට්ඨාසය
## பொலிஸ் ஊடகப் பிரிவு
## POLICE MEDIA DIVISION
14 වන මහල,සුහුරුපාය,බත්තරමුල්ල

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| දිනය Date | 2025.10.09 පැය 0630 | දුරකථන අංකය Tel.NO | 011-2887973 | මගේ අංකය My NO | D/Media/Out/1867/2025 | විද්‍යුත් ලිපිනය E-Mails | dir.media@police.gov.lk |


**පොලිස් මාධ්‍ය කොට්ඨාසය වෙත වාර්තා වූ වැදගත් තොරතුරු**

**01. හෙරොයින් ඇතුළු මත්ද්‍රව්‍ය සමඟ සැකකරුවෙකු හා සැකකාරියක් අත්අඩංගුවට - නුවරඑළිය කොට්ඨාස අපරාධ විමර්ශන කාර්යංශය.**

2025.10.08 වන දින දහවල් කාලයේ කඩවත පොලිස් වසමේ පහල බියන්විල ප්‍රදේශයේදී නුවරඑළිය කොට්ඨාස අපරාධ විමර්ශන කාර්යංශයේ නිලධාරින්ට ලද තොරතුරක් මත වැටලීමක් සිදු කර පහත මත්ද්‍රව්‍ය සමඟ සැකකරුවෙකු හා එම මත්ද්‍රව්‍ය ජාවාරමට අනුබල දුන් සැකකාරියක් අත්අඩංගුවට ගෙන ඇත.

- හෙරොයින් - කිලෝ 12 ග්‍රෑම් 90
- අයිස් මත්ද්‍රව්‍ය - කිලෝ 01 ග්‍රෑම් 490
- කුෂ් - කිලෝ 02 ග්‍රෑම් 300
- හෂීෂ් - කිලෝ 02 ග්‍රෑම් 410
- විද්‍යුත් තරාදි - 01

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 29 ක් හා සැකකාරිය වයස අවුරුදු 32 ක් වන අඟුලාන ප්‍රදේශයේ පදිංචිකරුවන් වේ.**

මොවුන් කඩවත පොලිස් වසමේ පහල බියන්විල ප්‍රදේශයේ තාවකාලිකව පදිංචිව සිටිමින් මෙම මත්ද්‍රව්‍ය ජාවාරම සිදු කර ඇති අතර නුවරඑළිය කොට්ඨාස අපරාධ විමරශන කාර්යංශය මඟින් අත්අඩංගුවට ගත් සැකකරුවෙකුගෙන් අනාවරණය වූ තොරතුරු මත මෙම වැටලීම සිදු කර ඇත.

නුවරඑළිය කොට්ඨාස අපරාධ විමරශන කාර්යංශය සහ කඩවත පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

**02. මනුෂ්‍ය ඝාතනයක් - මහරගම පොලිස් වසම.**

2025.10.08 වන දින උදෑසන කාලයේ මහරගම පොලිස් වසමේ පන්නිපිටිය ප්‍රදේශයේ පදිංචි පුද්ගලයෙකුට පහරදීමක් හේතුවෙන් ශ්‍රී ජයවර්ධනපුර රෝහල වෙත ඇතුළත් කර ප්‍රතිකාර ලබමින් සිටියදී මියගොස් ඇති බවට රෝහල් පොලිස් මුරපොලෙන් ලද පණිවිඩයකට අනුව මහරගම පොලිස් ස්ථානය මඟින් විමර්ශන ආරම්භ කර ඇත.

**මරණකරු වයස අවුරුදු 36 ක් වූ තලංගම ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

2025.10.08 වන දින අළුයම් කාලයේ මරණකරු පන්නිපිටිය ප්‍රදේශයේ පිහිටි ගොඩනැගිල්ලක් තුළදී පිරිසක් සමඟ ඇතිවූ පුද්ගලික ආරවුලක් දුරදිග යාම හේතුවෙන් මෙම පහරදීම සිදුව ඇති බවට දැනට සිදු කරන ලද විමර්ශනයේදී අනාවරණය වී ඇත.

මෘත ශරීරය ශ්‍රී ජයවර්ධනපුර රෝහලේ මෘත ශරීරාගාරයේ තැන්පත් කර ඇත. සිද්ධියට සම්බන්ධ අවුරුදු 29 හා 30 වයස්වල පසුවන බත්තරමුල්ල හා තලවතුගොඩ ප්‍රදේශවල පදිංචි සැකකරුවන් දෙදෙනෙකු කාර් රථයක් ද සමඟ අත්අඩංගුවට ගෙන ඇත. අනෙක් සැකකරුවන් අත්අඩංගුවට ගැනීම සඳහා මහරගම පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

## 03. පිහිනුම් තටාකයක ගිලී ළමයෙකු මියයාම - මිරිහාන පොලිස් වසම.

2025.10.08 වන දින සවස් කාලයේ මිරිහාන පොලිස් වසමේ නුගේගොඩ ප්‍රදේශයේදී හෝටලයක තිබූ පිහිණුම් තටාකයක ගිලී ළමයෙකු මියගොස් ඇති බවට මිරිහාන පොලිසියට ලද පණිවිඩයක් සම්බන්ධයෙන් විමර්ශනයක් ආරම්භ කර ඇත.

**මියගිය ළමයා වයස අවුරුදු 05 ක් වූ තලපත්පිටිය, නුගේගොඩ ප්‍රදේශයේ පදිංචිව සිටි පිරිමි දරුවෙකි.**

මෙම ළමයා පෙර පාසලේ ගුරුවරුන් සහ තවත් ළමුන් කණ්ඩායමක් සමඟ පුහුණුකරුවෙකු යටතේ පුහුණුවීම් කරන අතරතුරදී දියේ ගිලීම හේතුවෙන් ගොඩට ගෙන කළුබෝවිල රෝහලට ඇතුළත් කිරීමේදී මියගොස් ඇති බව සිදුකල විමර්ශනයේදී අනාවරණය වී ඇත.

මෘත දේහය කළුබෝවිල රෝහලේ මෘත ශරීරාගාරයේ තැන්පත් කර ඇති අතර මිරිහාන පොලිසිය විමර්ශන සිදුකරනු ලබයි.

## 04. විදුලිසැර වැදී කාන්තාවක් මියයාම - බණ්ඩාරවෙල පොලිස් වසම.

2025.10.08 වන දින සවස් කාලයේ බණ්ඩාරවෙල පොලිස් වසමේ වටගමුව ප්‍රදේශයේ එළවළු කොරටුවකදී කාන්තාවකට විදුලිසැර වැදීමෙන් මියගොස් ඇති බවට බණ්ඩාරවෙල පොලිසියට ලද පණිවිඩයක් මත විමර්ශනයක් ආරම්භ කර ඇත.

**මරණකාරිය වයස අවුරුදු 67 ක් වූ වටගමුව, බණ්ඩාරවෙල ප්‍රදේශයේ පදිංචිකාරියකි.**

මරණකාරියට එළවළු කොරටුවේ තිබූ ජල මෝටරයකට සම්බන්ධ කර තිබූ අනාරක්ෂිත විදුලි රැහැනක් පැගීමෙන් විදුලි සැර වැදීමෙන් මියගොස් ඇති බව දැනට සිදුකල විමර්ශනයේදී අනාවරණය වී ඇත.

මෘත දේහය දියතලාව රෝහලේ මෘත ශරීරාගාරයේ තැන්පත් කර ඇත. සිද්ධිය සම්බන්ධව බණ්ඩාරවෙල පොලිසිය විමර්ශන සිදුකරනු ලබයි.

## 05. මෘත ශරීරයක් හමුවීම - මැල්සිරිපුර පොලිස් වසම.

2025.10.07 වන දින දහවල් කාලයේ මැල්සිරිපුර පොලිස් වසමේ කැන්දවල ප්‍රදේශයේ ඉඩමක් තුල නාඳුනන මළ සිරුරක් ඇති බවට මැල්සිරිපුර පොලිස් ස්ථානයට ලද පැමිණිල්ලක් අනුව විමර්ශන ආරම්භ කර ඇත.

සිදුකරන ලද විමර්ශනයේදී මෘත ශරීරය ආසන්නයේ තිබී මුදල් පසුම්බියක් හමුවී ඇති අතර, එහි තිබූ හැඳුනුම්පත ඇතුළු ලේඛන වලින් මෙම පුද්ගලයා වයස අවුරුදු 64 ක් වන මුතූර් ප්‍රදේශයේ පදිංචිකරුවෙකු බවත් මොහු 2025.09.24 වන දින සිට අතුරුදහන් වී ඇති බවට මුතූර් පොලිස් ස්ථානයට පැමිණිල්ලක් ලැබී ඇති බවටත් අනාවරණය වී ඇත.

මෘත ශරීරය මහේස්ත්‍රාත් පරීක්ෂණයෙන් පසු කුරුණෑගල රෝහලේ මෘත ශරීරාගාරයේ තැන්පත් කර ඇති අතර මැල්සිරිපුර පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

## 06. තේ කර්මාන්ත ශාලාවක ඇතිවූ හදිසි ගින්නක් - නල්ලතන්නිය පොලිස් වසම.

2025.10.09 වන අද දින අළුයම් කාලයේදී නල්ලතන්නිය පොලිස් වසමේ පිහිටි ලක්ෂපාන තේ කර්මාන්ත ශාලාවේ කොටසක හදිසි ගින්නක් හටගෙන ඇති බවට නල්ලතන්නිය පොලිසියට ලද පණිවිඩයක් මත විමර්ශන ආරම්භ කර ඇත.

නල්ලතන්නිය පොලිසිය ප්‍රදේශවාසීන් එක්ව ගින්න මැඩපවත්වා ඇත. ගින්න හේතුවෙන් තුවාල හෝ ජීවිත හානි කිසිවක් සිදුව නොමැති අතර දේපල හානි පමණ සිදුව ඇත. ගින්නට හේතුව විදුලි කාන්දුවීමක් බව දැනට සිදු කරන ලද විමර්ශන වලදී අනාවරණය වී ඇත. නල්ලතන්නිය පොලිසිය වැඩිදුර විමර්ශනය සිදුකරනු ලබයි.

## 07. මාරක රිය අනතුරක් - නාඋල පොලිස් වසම.

2025.10.08 වන දින දහවල් කාලයේ නාඋල පොලිස් වසමේ ඒ 09 මාර්ගයේ බොබැල්ල ප්‍රදේශයේදී මාතලේ දෙස සිට දඹුල්ල දෙසට ධාවනය වූ ලොරි රථයක් රියදුරුට පාලනය කරගත නොහැකිව දකුණු මං තීරුවට ඇදී ගොස් ප්‍රතිවිරුද්ධ දෙසින් පැමිණි යතුරු පැදියක ද ගැටීමෙන් පසු මාර්ගයෙන් ඉවතට පැන පෙරළී ඇත. අනතුරින් යතුරු පැදිකරු හා ලොරි රථයේ රියදුරු තුවාල ලබා නාලන්ද රෝහලට ඇතුලත් කිරීමෙන් පසු යතුරු පැදිකරු මියගොස් ඇත.

**මරණකරු වයස අවුරුදු 51 ක් වූ මෛල්පිටිය ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

මෘත ශරීරය දඹුල්ල රෝහලේ මෘත ශරීරාගාරයේ තැන්පත් කර ඇති අතර නාඋල පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

## 08. මාරක රිය අනතුරක් - හෙට්ටිපොල පොලිස් වසම.

2025.10.08 වන දින දහවල් කාලයේ හෙට්ටිපොල පොලිස් වසමේ දිවුල්වැව බොරළුවැව මාර්ගයේ කිලෝමීටර් 05 කණුව ආසන්නයේදී බොරළුවැව දෙස සිට ගිරාතලාන දෙසට ධාවනය වූ යතුරු පැදියක් වංගු සහිත ස්ථානයකදී වේගය අඩු කිරීමේදී පසුපසින් එම දෙසටම ධාවනය වූ යතුරු පැදියක් එම යතුරුපැදියේ පසුපසින් ගැටී අනතුරක් සිදුව ඇත.

එම අවස්ථාවේ ඉදිරිපස යතුරු පැදියේ පැදිකරුට යතුරු පැදිය පාලනය කරගත නොහැකිව මාර්ගයේ පෙරළී ගොස් ඉදිරියෙන් පැමිණි ලොරි රථයකට යටවීමෙන් අනතුරක් සිදුව ඇත. අනතුරින් යතුරු පැදිකරු හා පසුපැදිකාරිය තුවාල ලබා හෙට්ටිපොල රෝහලට ඇතුලත් කිරීමෙන් පසු පසුපැදිකරු මියගොස් ඇත.

**මරණකරු වයස අවුරුදු 12 ක් වූ මදුල්ල ප්‍රදේශයේ පදිංචි පාසල් සිසුවියකි.**

මෘත ශරීරය හෙට්ටිපොල රෝහලේ මෘත ශරීරාගාරයේ තැන්පත් කර ඇති අතර හෙට්ටිපොල පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

## 09. මාරක රිය අනතුරක් - තඹලගමුව පොලිස් වසම.

2025.10.08 වන දින සවස් කාලයේ තඹලගමුව පොලිස් වසමේ ත්‍රිකුණාමලය අඹේපුස්ස මාර්ගයේ 98 හන්දිය ආසන්නයේදී කන්තලේ දෙස සිට ත්‍රිකුණාමලය දෙසට ධාවනය වූ යතුරු පැදියක් මාර්ගය අයිනේ රැඳී සිටි පදිකයෙකුගේ ගැටී අනතුරක් සිදුව ඇත. අනතුරින් යතුරු පැදිකරු සහ පදිකයා තුවාල ලබා කෝවිල්අඩි රෝහලට ඇතුලත් කිරීමෙන් පසු පදිකයා මියගොස් ඇත.

**මරණකරු වයස අවුරුදු 55 ක් වූ තෝප්පුව ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

මෘත ශරීරය කෝවිල්අඩි රෝහලේ මෘත ශරීරාගාරයේ තැන්පත් කර ඇති අතර තඹලගමුව පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

## 10. මාරක රිය අනතුරක් - මරදන්කඩවල පොලිස් වසම.

2025.10.08 වන දින සවස් කාලයේ මරදන්කඩවල පොලිස් වසමේ ඒ 09 මාර්ගයේ උලංකුලම ප්‍රදේශයේදී අනුරාධපුර දෙස සිට මරදන්කඩවල දෙසට ධාවනය වූ යතුරු පැදියක් පැදිකරුට පාලනය කරගත නොහැකිව මාර්ගයේ පෙරළී ගොස් අනතුරක් සිදුව ඇත. අනතුරින් යතුරු පැදිකරු තුවාල ලබා මරදන්කඩවල රෝහලට ඇතුලත් කිරීමෙන් පසු මියගොස් ඇත.

**මරණකරු වයස අවුරුදු 24 ක් වූ මරදන්කඩවල ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

මෘත ශරීරය මරදන්කඩවල රෝහලේ මෘත ශරීරාගාරයේ තැන්පත් කර ඇති අතර මරදන්කඩවල පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**